# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120
ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1250 / 2023
ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023 திகதி
දිනය / Date: 05/10/2023 පැය 0530

## මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුර.**

2023.10.04 වන දින දහවල් කාලයේ විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත රාගම පොලිස් වසමේ කුරුකුලාව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 490** ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන රාගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 27 ක්වූ එඬේරමුල්ල, වත්තල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

සැකකාරිය සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී, 2023.07.14 වන දින ගලපිටමඩ පොලිස් වසමේ දුනුමාල ප්‍රදේශයේදී පුද්ගලයෙකුට T56 ගිනි අවියකින් වෙඩි තබා ඝාතනය කිරීම හා 2023.08.01 වන දින මීගමුව ලෙල්ලමේදී පුද්ගලයෙකුට පිස්තෝල අවියකින් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයන්ට අදාල ගිනි අවි ප්‍රවාහනය සඳහා ආධාර අනුබල දී ඇති බවට අනාවරණය වී ඇත.

රාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වාද්දුව පොලිස් ස්ථානය.**

2023.10.04 වන දින දහවල් කාලයේ වාද්දුව පොලිස් වසමේ ගොරකගහවත්ත ප්‍රදේශයේදී වාද්දුව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 470** ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක්වූ ගොරකගහවත්ත, වාද්දුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාද්දුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2023.10.04 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ ජනතා මාවත ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 800 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක්වූ දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 04. රැඳවුම් නියෝග මත රඳවා ගෙන සිටි සැකකරුවෙකුගෙන් අපරාධ රැසක් අනාවරණය කර ගැනීමක් - තලංගම පොලිස් ස්ථානය.

2023.09.27 වන දින තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 400 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රැඳවුම් නියෝග මත රඳවා ගෙන ප්‍රශ්න කිරීමේදී තලංගම හා මුල්ලේරියාව පොලිස් වසම් වල නිවෙස් බිඳ මුදල් හා දේපල සොරකම් කිරීම් රැසකට සම්බන්ධ බවට අනාවරණය වී ඇත.

**රඳවා ගෙන සිටි සැකකරු වයස අවුරුදු 31 ක්වූ අංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

එම සැකකරුගෙන් අනාවරණය වූ තොරතුරු මත උණු කරන ලද රන්ගුලි 04 ක්, රන් පෙන්ඩන් 02 ක් හා කරාබු ජෝඩු 01 ක් පොලිසිය විසින් සොයාගෙන ඇත.

තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කරුවලගස්වැව පොලිස් ස්ථානය

2023.10.04 වන දින දහවල් කාලයේ කරුවලගස්වැව පොලිස් වසමේ ඔල්ලුක්කුලිය ප්‍රදේශයේදී කරුවලගස්වැව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වූ කරුවලගස්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කරුවලගස්වැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 06. විදුලි පංකාවක ගැටී පාසල් සිසුවෙක් මියයාම - පුස්සැල්ලාව පොලිස් වසම.

2023.10.04 වන දින දහවල් කාලයේ පුස්සැල්ලාව පොලිස් වසමේ පුස්සැල්ලාව හින්දු ජාතික පාසලේ පැවති උත්සවයක් අවසන්වීමෙන් පසු පාසලේ ඉගෙනුම ලබන පිරිමි දරුවෙකු විදුලි පංකාවක ගැටී තුවාල ලබා ගම්පොල රෝහලට ඇතුලත් කර ප්‍රථිකාර ලබමින් සිටියදී, මියගොස් ඇති බවට පුස්සැල්ලාව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මියගිය පිරිමි දරුවා වයස අවුරුදු 14 ක්වූ ඩෙල්ටා දකුණ කොටස, පුපුරැස්ස ප්‍රදේශයේ පදිංචි පාසල් සිසුවෙකි.**

මියගිය පාසල් සිසුවා තවත් ළමුන් කිහිපදෙනෙකු සමග සෙල්ලම් කරමින් සිටියදී පංති කාමරයේ පුටුවක් ආධාරයෙන් මේසයක් මතට නැඟිමේදී සිවිලිමේ සවිකර තිබූ

විදුලි පංකාවක් හිසේ ගැටී තුවාල වී ඇති බවට පොලිසිය සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය ගම්පොල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වීමට නියමිතව ඇත. පුස්සැල්ලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**07.** **දුම්රියේ ගැටී පුද්ගලයින් සිව් දෙනෙකු තුවාල ලැබීමක් - බේරුවල පොලිස් වසම.**

2023.10.04 වන දින දහවල් කාලයේ බේරුවල පොලිස් වසමේ හේනපාර මරක්කලාවත්ත අතුරු මාර්ගයේ පිහිටි දුම්රිය හරස් මාර්ගයෙන් ගමන් කල ත්‍රිරෝද රථයක් අනුරාධපුරය දෙස සිට බෙලිඅත්ත දෙසට ධාවනය වූ දුම්රියක ගැටී ඇති බවට බේරුවල පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**අනතුරින් තුවාල ලැබූ අවුරුදු 29 වයසේ පසුවන ත්‍රිරෝද රථයේ රියදුරු හා පිටුපස ගමන් කල පුද්ගලයෙකුද, වයස අවුරුදු 07 පිරිමි දරුවෙකු හා 1 ½ ක ගැහැණු දරුවෙකුද කම්පන තත්වයෙන් කළුතර නාගොඩ රෝහලට ඇතුලත් කර නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටී. තුවාලකරුවන් මරක්කලාවත්ත, බේරුවල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

බේරුවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08.** **පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - බණ්ඩාරවෙල කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2023.10.04 වන දින දහවල් කාලයේ හපුතලේ පොලිස් වසමේ දුම්රියපොල පාර ප්‍රදේශයේදී බණ්ඩාරවෙල කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් කරමින් සිටි සැකකරුවෙකු කැණීම් උපකරණ හා පූජා භාණ්ඩ** සමඟ අත්අඩංගුවට ගෙන බණ්ඩාරවෙල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන හපුතලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බණ්ඩාරවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**09.** **මාරක රිය අනතුරක් - කහටගස්දිගිලිය පොලිස් වසම.**

2023.10.04 වන දින සවස් කාලයේ කහටගස්දිගිලිය පොලිස් වසමේ කැකිරාව හන්දිය ගනේවල්පොල මාර්ගයේ දියමයිලගස්වැව ප්‍රදේශයේදී කැකිරාව හන්දිය දෙස සිට ගනේවල්පොල දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගය අසල පිහිටි ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු කහටගස්දිගිලිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වන දියමයිලගස්වැව, මහපොතාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කහටගස්දිගිලිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කහටගස්දිගිලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**10.** **මාරක රිය අනතුරක් - කොහුවල පොලිස් වසම.**

2023.10.04 වන දින සවස් කාලයේ කොහුවල පොලිස් වසමේ කළුබෝවිල රෝහල මාර්ගයේ කළුබෝවිල ප්‍රදේශයේදී කොහුවල දෙස සිට දෙහිවල දෙසට ධාවනය වූ මෝටර් රථයක් ඊට ප්‍රතිවිරුද්ධ දිශාවෙන් පැමිණි ත්‍රීරෝද රථයක මුහුණට මුහුණ ගැටී ත්‍රීරෝද රථය ඉදිරියට ඇදී ගොස් මාර්ගය අසල නිවසක ගේට්ටුවකද ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ ගමන්ගත් මව සමඟ දරුවෙකු බරපතල තුවාල ලබා කළුබෝවිල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ රිජ්වේ ළමා රෝහලට ඇතුලත් කිරීමෙන් පසු දරුවා මියගොස් ඇති අතර මව එම රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි. අනතුරින් ත්‍රීරෝද රථයේ ගමන් කල තවත් කාන්තාවක් තුවාල ලබා කළුබෝවිල රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි.

**මිය ගිය පිරිමි දරුවා වයස අවුරුද්දක් වන යානගම්පල, නුගේගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රිජ්වේ ළමා රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධ මෝටර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කොහුවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - චුන්නාකම් පොලිස් වසම.

2023.10.04 වන දින රාත්‍රී කාලයේ චුන්නාකම් පොලිස් වසමේ යාපනය කන්කසන්තුරය මාර්ගයේ උප්පුමඩම් ප්‍රදේශයේදී යාපනය දෙස සිට කන්කසන්තුරය දෙසට ධාවනය වූ යතුරුපැදියක් එම දිශාවටම මාර්ගයේ නවතා තිබූ කාර් රථයක දකුණු පස පිටුපස දොර විවෘත කිරීමේදී යතුරුපැදිය එහි ගැටී පැදිකරු මාර්ගයේ ඇද වැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු යාපනය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 35 ක් වූ චුන්නාකම් දකුණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය යාපනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. චුන්නාකම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**